# බෞද්ධ චතුෂ්කෝටික හා අමරාවික්ඛේපවාදීන්ගේ පංචකෝටික තර්ක ක්‍රම පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්

**දිල්ශාන් මනෝජ් රාජපක්ෂ**
පර්යේෂණ සහකාර, පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය, කැලණිය විශ්වවිද්‍යාලය
dilshanmanojrajapaksha@gmail.com

**සංක්ෂේපය**

පෙරදිග හා අපරදිග දාර්ශනික සම්ප්‍රදායවල සාකච්ඡා කෙරී ඇති ප්‍රධාන දාර්ශනික ප්‍රස්තුත හා තේමා අතර තර්ක ශාස්ත්‍රයට (Logic) ද හිමි වන්නේ සුවිශේෂ ස්ථානයක් වන අතර ඒ ඒ දාර්ශනික සම්ප්‍රදා හා වාදවලින් පෙන්වා දී ඇති තර්ක ක්‍රමවල විවිධත්වයක් ද ඇත. මේ අනුව බටහිර දර්ශනයේ තර්ක ශාස්ත්‍රයේ පියා ලෙස සැලකෙන ඇරිස්ටෝටල් නම් දාර්ශනිකයා ඉදිරිපත් කර තිබෙන ද්වි කෝටික තර්ක ක්‍රමයට වැදගත් තැනක් හිමි වේ. අන්ත හෙවත් සංවාක්‍ය දෙකකින් යුත් තර්ක ක්‍රමයකින් ඔබ්බට තර්ක චින්තනය මෙහෙය වූ පෙරදිග දාර්ශනික චින්තා වන බුදුදහමෙහි චතුෂ්කෝටික තර්ක ක්‍රමයක් ද සංශයවාදී චින්තාවෙහි පංචකෝටික තර්ක ක්‍රමයක් ද ජෛන සමයෙහි සප්තකෝටික තර්ක ක්‍රමයක් ද මෙහෙය වන බව පෙනේ. මෙම පර්යේෂණයේ දී මූලික වශයෙන් සංශයවාදී හා බෞද්ධ තර්ක ක්‍රම කෙරේ අවධානය යොමු කෙරෙන අතර එම තර්ක ක්‍රම තුළින් පැනෙන ඥාන විභාගාත්මක පදනම සාකච්ඡාවට ලක්කෙරේ. සංශයවාදය යන්න සඳහා සංදේහවාදය යන්න ප්‍රධානතම පර්යායක් වන අතර පාලි සාහිත්‍යයට අනුව භාරතීයයන් මේ සඳහා ව්‍යවහාර කර ඇත්තේ අමරාවික්ඛේපවාදය යන පදය යි. අමරාවික්ඛේපවාදය පිළිබඳ කරුණු අන්තර්ගත මූලික ම පාලි මූලාශ්‍රය වනුයේ දීඝනිකායේ එන සාමඤ්ඤඵල සූත්‍රය හා බ්‍රහ්මජාල සූත්‍රය මෙන් ම එම සූත්‍රවල අටුවා ය. දීඝනිකායේ බ්‍රහ්මජාල සූත්‍රයට අනුව අමරාවික්ඛේපවාදය නමින් හැඳින්වූ ගුරුකුල සතරක් පැවතුණු අතර ෂඩ් ශාස්තෘන් අතරින් සංශයවාදී චින්තනය මෙහෙය වූ සංජය බෙල්ලට්ඨිපුත්තයන් වනාහි ඉහත කී ස්වකීයීය අඥානභාවය පදනම් කරගෙන සංශයවාදය මෙහෙය වන ලද ගුරුකුලයේ නායකයා නැතහොත් සාමාජිකයෙක් විය යුතු ය. සත්‍යොක්ෂණය කළ නො හැකි මරණින් මතු පැවැත්ම ආදී අධිභෞතික කරුණු හා හොඳ, නරක ආදී ආචාර විද්‍යාත්මක කරුණු කෙරේ ඔහුගේ අවධානය යොමු වී ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස පංචකෝටික නය හෙවත් පංචකෝටික තර්ක ක්‍රමයක් භාවිත වූ බව පෙනේ. දීඝනිකාය අටුවාවට අනුව මෙම පංච භංගි නයෙහි එක් එක් ප්‍රස්තුත කෙරෙන් අපේක්ෂා කරන ලද අරමුණු ද වේ. කිසිසේත් සත්‍යොක්ෂණ කළ නො හැකි හෝ සත්‍යොක්ෂණය කළ හැකි නමුත්, එසේ කිරීමෙන් ඵලක් නැති හෝ සත්‍යොක්ෂණය කළ හැකි නමුත්, තවමත් සිදු නො කළ යමක් පිළිබඳ විය හැකි යැයි සැලකිය හැකි මෙම භව්‍යතා සංජය මෙන් ම අනෙක් සංශයවාදී ගුරුකුල තුන ද පංචභංගී නය භාවිත කර ඇත්තේ තමන් කිසිදු ආකාරයක අන්තවාදයක් නො දරන බව ප්‍රකට කිරීමට බව පෙනේ. අමරාවික්ඛේපවාදීන්ගේ පංචභංගී නයෙන් බෞද්ධ චතුෂ්කෝටියේ විශේෂත්වය වන්නේ ප්‍රස්තුත සතර අතරින් සැමවිට ම එකක් පමණක් සත්‍ය වන බව පෙන්වා දීමෙනි. ප්‍රස්තුත සතර ප්‍රතික්ෂේප කරනුයේ අධිභෞතික යැ'යි සැලකෙන විෂය සම්බන්ධයෙන් පමණි. බුදුදහම චතුෂ්කෝටික

නය හුදෙක් භාෂා මෙවලමක් ලෙස සලකා ඇත්තේ උපයෝගිතා පදනමකින් නිසා පරිපූර්ණ සත්‍ය ප්‍රකාශක වාහකයක් ලෙස එය උපයුක්ත කර ගැනීම සම්බන්ධයෙන් සඳහනක් කිසිදු තැනක දක්නට නොමැත. මෙහි දී අපගේ මෙම කාර්යයට චතුෂ්කෝටික තර්ක ක්‍රමය සැලකිල්ලට භාජනය වනුයේ මෙමගින් බුදුදහම සාරවාදය *(Essentialism)* හා ඒකාන්තවාදය *(Abosolutism)* ප්‍රතික්ෂේප කරන බැවින් එම සංකල්ප මත පදනම් ව ඇති සත්‍ය හා අසත්‍ය යන ද්වාවිධකරණයන් යුතු තර්ක ක්‍රමය ද බැහැර කරන අකාරය පෙනී යන නිස යි. අන්තවාදයකට නො වැටී, අන්තවාදවල නො ගැටී දාර්ශනික මධ්‍යස්ථතාව පිළිබිඹු කිරීම අතින් බෞද්ධ චතුෂ්කෝටිකය හා අමරාවික්ඛේපවාදීන්ගේ මෙම පංචකෝටික නය සමානත්වයක් පිළිඹිබු කරන අතර එම අගය සදාචාරාත්මක වශයෙන් ද ඇගයීමට ලක් කරන විට බෞද්ධ චතුෂ්කෝටික පදනම තවදුරටත් විශේෂ වන්නේ එයින් ගැඹුරු ආධ්‍යාත්මික පදනමක් ද අවධාරණය වන බැවිනි.

**ද්වි කෝටිකය සහ බැඳුණු ඥානයෙහි සීමාව**

ඇරිස්ටෝටල් හඳුන්වා දුන් තර්ක ක්‍රමය ද්විකෝටික තර්ක ක්‍රමය, අගය දෙකකින් යුත් තර්ක ක්‍රමය *(Two Valued Logic)* උභයාන්ත තර්ක ක්‍රමය *(Bi – Valent logic)* යනුවෙන් ද හඳුන්වයි. ඇරිස්ටෝටලියානු තර්ක ක්‍රමය තුළ දැකිය හැක්කේ ප්‍රස්තුත දෙකක් පමණි. ඒ අනුව කිසියම් ප්‍රකාශයක් එක්කෝ සත්‍ය *(Truth)* විය යුතු ය. නැතිනම් එය අසත්‍ය *(Fault)* විය යුතු ය. සත්‍ය ද වේ. අසත්‍ය ද වේ යන අඩක් සත්‍ය අඩක් අසත්‍ය ප්‍රස්තුත මෙහි දී වලංගු වන්නේ නැත. එයට හේතුව නම්, මෙම උභයාන්ත ප්‍රස්තුත ක්‍රමයට පදනම් වූ මූලික මූලධර්ම තුනක් තිබීම යි. චින්තනය හා සම්බන්ධ *(Laws of Thought)* මෙම මූලධර්ම තුන නම්,

1. අනන්‍යතා මූලධර්මය *(Principle of Identity)*
2. විසංවාදිතා මූලධර්මය *(Principle of contraction)*
3. මධ්‍ය බහිෂ්කෘත මූලධර්මය *(Principle of excluded middle)*[1] යනු යි.

කිසියම් ධර්මතාවක් (වස්තුවක් හෝ ප්‍රකාශයක්) තමා හා අනන්‍ය විය යුතු බව අනන්‍යතා මූලධර්මයෙන් අවධාරණය කෙරේ. ප්‍රකාශයක් හැඳින්වීම සඳහා අප 'P' යන්න යෙදුවහොත් 'n' යන්නෙන් "නොවේ" යන්න අර්ථවත් කළහොත් මෙම මූලධර්ම "P සහ nP" යනුවෙන් දැක්විය හැකි ය.[2] දෙවැන්නෙන් අදහස් කෙරෙනුයේ කිසියම් අන්‍යෝන්‍ය ප්‍රතිවිරුද්ධ ප්‍රකාශ දෙකක් එකවර සත්‍ය විය නො හැකි බව යි. සංකේතාත්මක ව දක්වතොත් එය – (P nP) හෙවත් 'P' යනු 'P නොවේ' යන දෙක එක විට සත්‍ය නොවේ, යනුවෙන් දැක්විය හැකි ය.[3] මේ අනුව "පෙරේරා ගුරුවරයෙකි", "පෙරේරා ගුරුවරයෙකු නොවේ" යන ප්‍රකාශ දෙක එක් පුද්ගලයෙකු වූ පෙරේරා සම්බන්ධයෙන් එක විට සත්‍ය හෝ අසත්‍ය විය නො හැකි ය. තෙවැන්නෙන් කියවෙනුයේ "P වේ" හෝ "P නොවේ" යන ප්‍රකාශ දෙකෙන් එකක් අනිවාර්යයෙන් ම සත්‍ය විය යුතු බවත්, ඒ දෙක අතර මැද තත්ත්වයක් තිබිය නො හැකි බවත් ය.[4] ඒ අනුව "පෙරේරා ගුරුවරයෙකු වන්නේ ද නො වන්නේ ද වේ", යනුවෙන් කීම ද්විකෝටික තර්ක ක්‍රමය උල්ලංඝනය කිරීමකි.

ඇරිස්ටෝටලියානු උභයාන්ත තර්ක ක්‍රමය බටහිර ලෝකයා අතර වසර දෙදහසකට අධික කාලයක් පැවතී ඇති අතර මෑතක් වන තුරු ම බොහෝ දෙනෙකුට මෙම තර්ක ක්‍රමයෙන් පරිබාහිර තර්ක ක්‍රමයක් පිළිබඳ ව සිතීමට නො හැකි විය. එහෙත් 19 වන සියවස අග භාගයෙහි හා 20 වන සියවස මුල් භාගයේ දී ජෑන් ලුකාසිවික්ස් (*Jan Lukasiewicz*) ප්‍රධාන පෝලන්ත තර්ක ශාස්ත්‍රඥයන් විසින් ඇරිස්ටෝටලියානු තර්ක ක්‍රමය විචාරයට ලක් කර අසම්ප්‍රදායික තර්ක ක්‍රම පිළිබඳ අත්හදා බැලීම් කරන ලදී.[5] ඇරිස්ටෝටලියානු නිගාමී තර්ක ක්‍රමයේ භාවිතය අනුව ලැබෙන වාසි මෙන් ම අවාසි ද ඇති බව පසු ව බෙහෝ දෙනාට වැටහුණ කරුණකි.

***''සියලු මිනිසුන් මැරෙන සුලු ය.''***
***''සොක්‍රටීස් මිනිසෙකි.''***
***''සොක්‍රටීස් මැරෙන සුළු ය.''***

ඉහත දැක්වෙන පරිදි ඉදිරිපත් කළ හැකි නිගාමී තර්ක ක්‍රමයෙන් ලැබෙන නව ඥානයක් නොමැති වීම මෙහි ලා මූලික කරුණකි. හුදු පුනර්වාචක ඉදිරිපත් වීම, දෝෂ නිගමනවලට එළඹිය හැකි වීමේ අවදානම යනාදී සාධක[6] ද මෙහි දී නාගාමී තර්ක ක්‍රමයේ ඇති දුර්වලතාවලට සාක්ෂ්‍ය ය.

එදිනෙදා ජීවිතයේ අප අත් විඳින අත් දැකීම් සියුම් ව පරීක්ෂා කළහොත් උභයාන්ත තර්ක ක්‍රමයෙහි පවත්නා අඩු පාඩු නිතැතින් ම දිස්වේ. නිසි ලෙස නො වැසූ දොර නිසි ලෙස විවෘත ව ද නොවන අවස්ථාවක්, ආරම්භ කළ නමුත් නිසි ලෙස නිම නො කළ කටයුත්තක් යනාදිය ප්‍රකාශයට පත් කිරීමේ දී උභයාන්ත තර්ක ක්‍රමය තුළින් කිසිසේත් ම ඉදිරිපත් කළ නො හැකි ය. අධිකරණ ක්‍රමය තුළ චූදිතයාගෙන් ප්‍රශ්න කෙරෙනුයේ ද ද්විකෝටිකය භාවිත කරමිනි.

*''යුෂ්මතා වැරදිකරු ද? නිවැරදිකරු ද?"*


උසාවියේ සිදු වන සාක්ෂ්‍ය විභාගවල දී ද ඇතැම් විට විරුද්ධාභාසීය ප්‍රශ්න විමසා සාක්ෂ්‍යකරුවන්ගේ ප්‍රකාශන විසංවාදී කරන තර්කයට දක්ෂ නීතිඥවරු මෙවැනි ප්‍රශ්න විමසති.[7]

*''යුෂ්මතා මත් කුඩු විකිණීම නැවැත්වූයේ පෙරේදා සිට නේද?''*

කිසිදා මත් කුඩු නො විකුණූ අයෙකුගෙන් මෙබඳු පැනයක් විමසූ විට ඔහුට දිය හැකි *''එසේ ය''* හෝ *''එසේ නොවේ ය''* යන පිළිතුරු දෙකෙන් කුමක් ලබා දුන්න ද වැරදිකරුවෙකු බවට පත් වේ. මෙබඳු උභතෝ කෝටික ප්‍රශ්නවලට පිළිතුරු ලබා දීමේ දී ද්විකෝටික තර්ක ක්‍රමයෙහි ඇති උපයෝගීතාවක් නොමැත.

සංකීර්ණ අවස්ථාවල දී උභතෝකෝටික ප්‍රවේශ පිළිබිඹු කරන දුර්වලතා ඇතැම් විට ආසියාතික ආගමික දාර්ශනික සාමාජික පසුබිම බටහිර ඇරිස්ටෝටලියානු තර්ක ක්‍රමයට වඩා ඉදිරියෙන් සිටින බව පැහැදිලි වේ. මෙයට කදිම නිදසුනක් වන්නේ, චීනයේ පහළ වූ ''යින් සහ යැං'' දාර්ශනික ගුරුකුලයේ

*(Yin and Yang)* අදහස් ය. තාඕ වාදයේ නිතර භාවිත වන 'යින්' යැං (අඳුර සහ ආලෝකය) රූගත් රේඛා චිත්‍රය ගෙනහැර දක්වන  එම දර්ශනික චින්තාවන් සොබා දහමේ එකිනෙකට ප්‍රතිවිරුද්ධ සාරයන් නැතහොත් බලවේගයන් දෙකක් හා ඒවායේ සබඳතාව විදහා දක්වයි.[8]



මෙහි සුදු පාට පසුබිමේ ඇති කළු පාට බීජය සුදු පාට ඇති කරයි. කළු පාට පසුබිමේ ඇති සුදුපාට බීජය කළු පාට ඇති කරයි.[9] සමාජයේ ජීවත් වන සෑම චරිතයකට පාහේ යහපත් ගතිගුණ මෙන් ම අයහපත් ගතිගුණ ද මිශ්‍ර ව පවතී. පැතලි චරිත දක්නට නොමැත. එය සොබාදහමේ එක්තරා සුවිශේෂ ලක්ෂණයකි.

**සංශයවාදී ගුරුකුලය හා පංචකෝටික නය**

ඍග්වේදය හරහා සපැමිණි සංශයවාදී නැමියාවන් බ්‍රාහ්මණ, උපනිෂද් යුගවල දී පවා අළු යට සැඟ වී ගත් ගිනි පුපුරු මෙන් ඥානයෙහි විමර්ශනාත්මක අභිරුචිය තදින් ම අපේක්ෂා කළ බව පෙනේ. ආදි වෛදික චින්තනයෙහි දිවෙන මෙම සංශයවාදී අදහස් දීර්ඝ කාලයක් තිස්සේ විවිධ ස්වරූපවලින් විකාශය වූ අතර අවෛදික සංශයවාදී ගුරුකුලවල වර්ධනයට පවා එය මාවත සැකසූ බව පෙනේ.

ක්‍රි.පූ. 6 වන සියවස භාරතීය සමාජය තුළ බුදු සමයේ උදාව සිදු වන විට අතිවිශාල ආගම් හා දර්ශන සම්ප්‍රදා ප්‍රමාණයක් පැවති බව බෞද්ධ හා ජෛන මූලාශ්‍රයවලින් පෙනේ. වෛදික යුගයෙන් අනතුරු ව වෛදික නො වන හෙවත් අවෛදික චාර්වාක දර්ශනයට පසු හා බුදු සමයේ උදාවට ආසන්න සමය අතර කාලය තුළ සංශයවාදී ගුරුකුලයේ ප්‍රභවය සිදු වූ බව සිතිය හැකි ය. මෙම සංශයවාදී ගුරුකුලය පිළිබඳ මනා වූ අවබෝධයක් ලබා ගැනීම සඳහා දැනට හමු වන පැරණිතම හා වැදගත් ම මූලාශ්‍රය දෙක ඇසුරෙන් තොරතුරු රැසක් අනාවරණය කරගත හැකි ය. එපමණක් ද නොව, එම මූලාශ්‍රය දෙක මෙම සංශයවාදී ගුරුකුලය පිළිබඳ තොරතුරු අනාවරණය කරන්නේ අංශ ද්වයකින් බව ද පෙනේ. එනම්,

1. ජෛනාගමේ මූලාශ්‍රයක් වන සූත්‍රකෘතාංගය හා ඊට අර්ථ විවරණ සපයන ශිලාංකගේ විස්තරවල විග්‍රහ වන භාරතීය සංශයවාදී ගුරුකුලයේ බුද්ධිමය අංශය
2. බ්‍රහ්මජාල, සාමඤ්ඤඵල යන සූත්‍ර දේශනා ප්‍රධාන කොට ගත් බෞද්ධ මූලාශ්‍රයෙහි විග්‍රහ වන භාරතීය සංශයවාදී ගුරුකුලයේ සදාචාරාත්මක අංශය යනාදිය යි.

**ජෛන මූලාශ්‍රවල විග්‍රහ වන භාරතීය සංශයවාදීන්ගේ බුද්ධිමය අංශය**

බ්‍රහ්මජාල සූත්‍රයේ සඳහන් වන ආකාරයට සමකාලීන සමාජයේ ආගම් හෝ චින්තන කණ්ඩායම් සැට දෙකක් (62) පැවතිණ. එම ආගම් හෝ චින්තන කණ්ඩායම් සැට දෙකෙන් සතරක් සංශයවාදී ගුරුකුලයට අයත් ය. මෙම අනාවරණයට අමතර ව වෙනත් ලිඛිත මූලාශ්‍රය ලෙස භාරතීය සංශයවාදය පිළිබඳ තොරතුරු රැසක් සූත්‍රකෘතාංගයේ හා ශිලාංක නැමැත්තා ඊට සපයන අටුවාව තුළින් හෙළි වේ. සූත්‍රකෘතාංගය ජෛන මූලාශ්‍රයකි. මෙහි සඳහන් වන ආකාරයට භාරතයේ පැවති ගුරුකුල හෙවත් චින්තන කණ්ඩායම් ප්‍රමාණය තුන්සිය හැටතුනකි (363).[10] ශිලාංක මෙම ගුරුකුල නාමාවලිය ප්‍රධාන කාණ්ඩ සතරක් යටතේ දක්වා ඇත්තේ මෙසේ ය.

| | | | |
|---|---|---|---|
| 1. | ක්‍රියාවාදීන් | - | 180 |
| 2. | අක්‍රියවාදීන් | - | 84 |
| 3. | අඥානවාදීන් | - | 67 |
| 4. | වෛනයිකයන් | - | 32 |
| | එකතුව | = | 363 |

මෙතරම් අතිවිශාල චින්තන කණ්ඩායම් ප්‍රමාණයක් භාරතීයේ පැවති බව සිතීමටත් අපහසු තරම් ය. මහාචාර්ය කේ. එන්. ජයතිලක මහතා දක්වන ආකාරයට අනුව සත්‍ය වශයෙන් මෙවැනි ගුරුකුල හෝ චින්තන කණ්ඩායම් නො පැවති බව පෙනෙන අතර මේවා වැඩි කොට ම කෘතිම ව තනා ගත් ඒවා ලෙස සිතිය හැකි ය. කෙසේ නමුත්, මෙම චින්තන කණ්ඩායම් තැනී ඇත්තේ ජෛන සංකල්පවලට සමාන්තර ව බව පෙනේ.

සූත්‍රකෘතාංගයේ සඳහන් චින්තන කණ්ඩායම් නාමාවලිය අතුරින් අපගේ සාකච්ඡාවට බඳුන් වන සංශයවාදී පිරිස් හඳුන්වා ඇත්තේ අඥානවාදීන් ලෙස යි. අර්ධ මාගධී භාෂාවෙන් දැක්වෙන ''අණ්ණානියා'' යන්න සංස්කෘත භාෂාවෙන් ''අඥානිකාඃ'' හෙවත් ''අඥානිනඃ'' යනුවෙන් දැක්වේ.[11] මෙයින් අදහස් කොට ඇත්තේ සංශයවාදය ප්‍රශස්ත කොට සැලකුවන් හෙවත් ඥානය අභව්‍ය යැයි සැලකුවන් ය. සූත්‍රකෘතාංගයෙහි අට්ඨකථාචාර්ය ශිලාංක අඥානිකඃ යන පදය විවිධාර්ථයෙන් ගෙන ඇති බව කේ. එන්. ජයතිලක මහතා පෙන්වා දෙයි. ශිලංකට අනුව සූතකෘතාංගයෙහි භාවිත වී ඇති ''අඥාන'' යන්න එවක ආගමික ගුරුවරුන් හැඳින්වීම සඳහා භාවිත කර ඇත. ඔහුගේ අදහස වන්නේ, අඩු හෝ වැඩි වශයෙන් බෞද්ධයන් ද, අඥානිකයින් වන බව යි. ඊට හේතුව නම්, කර්ම, බන්ධනෙයහි ප්‍රතිඵලයක් නිසා ඇති වන්නක් නොව අඥානකත්වය නිසා සිදුවන්නක් ලෙස (ඇත්තෙන් ම ඔහු මෙයින් අදහස් කොට ඇත්තේ අනභිප්‍රායී යන්න යි) සලකා ඇති බැවිනි.[12] සූත්‍රකෘතාංගයේ දැක්වෙන චින්තන කණ්ඩායම් අතර අඥානවාදින්ගේ ගුරුකුල 67ක් පැවතී ඇත.[13]

චේතනාවන්ගේ පහළ වීම පිළිබඳ චතුර්විධ අභිධාන හෙවත් චතුෂ්කෝටි ක්‍රමවේදයක් පිළිබඳ අවබෝධය සංශයවාදීන්ට පැවති බවත්, ආධානග්‍රාහී ලෙස තනි මතයක එල්බ සිටීම නිෂ්ඵල බවත් මෙමගින් පැහැදිලි වේ. ශිලාංක සිය අර්ථ විවරණවලින් දක්වන අදහස් අතර සංශයවාදය ගුරුකුලයක් ලෙස නිර්මාණය වීමට බලපෑ හේතුව ද දක්වයි. එනම්, අන්‍යෝන්‍ය වශයෙන් වෙනස් මතවාද ගැටීම සදාචාරාත්මක වශයෙන් ගැටලු රැසක් පැන නැගීමට හේතුව බව සංශයවාදීන්ගේ අවධානය යොමු වීම යි. ස්ථාවර නොහොත් ඒකාන්ත මතයක හිඳීමෙන් මතුවන අර්බුද මත පදනම් වී යොමුවිය හැකි විකල්පය නම් ගැටලු මතු නො වන හෝ ඒවා මඟහරවා ගතහැකි අනේකාන්තය යි. ව්‍යාකූල බුද්ධිමය මත වාදවල විවිධත්වය හෙවත් ඥානය වශයෙන් ගනු ලබන ස්ථාවරවල සදොස් මෙහි දී හඳුන්වා ඇත්තේ, ''බහුතර දෝෂ සම්භවාත්'' යනුවෙනි. සංශයවාදීන් මෙකල නො සිටියේ නම්, මෙම සදාචාරාත්මක නිගමනය සූත්‍රාකෘතාංග ඇසුරෙන් ශිලාංක කිසිසේත් කෘතිම ව තනා ඉදිරිපත් නො කරනු ඇත. උක්ත උධෘතය තවදුරටත් සලකා බැලීමෙන් පැහැදිලි වන්නේ ඥානය පිළිබඳ ඍජු නිගමනයකට එළඹීමේ දුෂ්කරතාවයත්, එලෙස ඥානය පිළිබඳ ගෙනහැර දක්වන ස්ථාවර අන්‍යොන්‍ය වශයෙන් විසංවාදී වීමේ ඇති හැකියාවත්, කවරක් නියම සත්‍ය ලෙස ගත යුතු ද? යන්න නිගමනය කිරීමේ අපහසුතාවයත් සංශයවාදීන්ගේ මූලික අවධානයට පාත්‍ර වූ බව යි. සමස්තයක් ලෙස ශිලාංකගේ විස්තර කථනවලින් ප්‍රකට වන සංශයවාදීන් ඥානය පිළිබඳ දරූ අදහස් කිහිපයක් මෙසේ ගොනු කළ හැකි ය.

1. ඥානය පිළිබඳ ඍජු නිගමනයකට එළඹීමේ දුෂ්කරතාවය, ඥානය පිළිබඳ විවිධ ස්ථාවර අන්‍යොන්‍ය වශයෙන් විසංවාදී වන බව මෙන් ම කවරක් සත්‍ය ද? යන්න තෝරා බේරා ගැනීමේ අපහසුව අවධාරණය කිරීම.
2. සර්වඥතාවය ප්‍රතික්ෂේප කිරීම.
3. අන්‍යයන්ගේ අභ්‍යන්තරික තත්ත්වයන් නොහොත් මානසික තත්ත්වයන් හෝ සිතුවිලි, දැන ගත නො හැකි බව පෙන්වා දීම.
4. ඉන්ද්‍රියානුභූතිය පොදු වාස්තිකත්වයකින් සැලකිය නොහැකි බව පෙන්වා දීම.
5. ඥානයක් යනුවෙන් යමක් පැවතිය ද, එහි ප්‍රයෝජනයක් නැති බව දැක්වීම.
6. ඒකාන්තවාදයකින් මිදුණු සංශයවාදය ශ්‍රේෂ්ඨ බව අවධාරණය කිරීම, යනාදිය යි.

**පෙළ දහම තුළ විග්‍රහ වන අමරාවික්ඛේපවාදීන්ගේ මූලික ලක්ෂණ**

ඥානයෙහි නොපෙනෙන පැත්ත ඉවත් කොට පෙනෙන පැත්ත පමණක් කතා කිරීම ''අර්වාහ් දර්ශනය'' නම් වේ.[14] යම් වස්තුවක් දෙස බලන ආකාරය අනුව එහි පෙනෙන පැත්තට අමතර ව නො පෙනෙන වස්තුවක් ද ඇති නිසා පෙනෙන අයුරින් ම ඒ පිළිබඳ සර්ව සම්පූර්ණ නිගමනයක් ලබා දිය නො හැකි බව යි. ඥානයෙහි පවත්නා සාපේක්ෂ බව පදනම් කොට ගෙන සැක ඉපදවීම සංශයවාදීන්ගේ වැදගත් ලක්ෂණයකි. භාරතීය සංශයවාදීන්ට ආවේණික තවත් සුවිශේෂ ලක්ෂණයක් වනුයේ සදාචාරාත්මක හා මනෝවිද්‍යාත්මක අංශය කෙරේ අවධානය යොමු කිරීම යි. මුසාවාදය, උපාදානය, හා අනුයෝගය යනාදිය මුල් කොට ගෙන සංශය මෙහෙය වූ මුල් අමරාවික්ඛේපවාදී කණ්ඩායම් තුන මෙහි

දී වැදගත් වේ. සත්‍ය කරුණු හැරුණු විට ඥානය ඇසුරෙන් සම්භාවිතා පවතින දෑ පිළිබඳ අභ්‍යුපගමන ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කළ මොවුන් ඒ සඳහා කරුණු දෙකක් සැලකිල්ලට ගත් බව පෙනේ. එනම්,

01. සාක්ෂ්‍ය රහිත ඥානය අවිනිශ්චිත දෙයකි. එයින් ගැටලු මතු වේ.
02. සාක්ෂ්‍ය රහිත ඥානය පිළිබඳ නිගමන දීම මානසිකවත් සදාචාරාත්මකවත් ගැටලු මතු වේ, යනාදිය යි.

අධිභෞතික කරුණු සත්‍යෝක්ෂණය කළ නො හැකි ය. එබැවින් ඒවා පිළිබඳ ඥානයක් ඇති කර ගැනීම කෙසේවත් කළ නො හැකි ය, යන්න මොවුන්ගේ අදහස යි. එමෙන් ම අධිභෞතික නොවූවත් අනුභූතිවාදී ව ඥානය මෙහෙය විය නොහැකි ලොව අන්තවත් ද?, අනන්තවත් ද? යනාදී ප්‍රශ්න මෙම පිරිසගෙන් විමසුවේ නම් සත්‍ය වශයෙන් ම ඊට පිළිතුරු ලබා දීමෙන් වැළකී සිටිනු ඇත. ඊට හේතුව නම් සත්‍යෝක්ෂණය කළ නො හැකි වීම යි. බුදු සමයට ප්‍රථම ව අව්‍යාකත ප්‍රශ්න පිළිබඳ යම් ආකල්පයක් මෙම සංශයවාදී පිරිස අතර තිබෙන්නට ඇති බව සිතිය හැකි ය. සත්‍ය වූ නිවැරදි ඥානය මත පදනම් වී අමරාවික්ඛේපවාදීන් අවධාරණය කළ විමුක්ති මාර්ගයක් ද පැවති බව ඇතැම් විද්වතුන්ගේ මතය යි. මහාචාර්ය ජයතිලක මහතා පෙන්වා දෙන්නේ, සූත්‍රකෘතාංගයේ ක්‍රියාවාදීන්, අක්‍රියවාදීන් හා වෛනයිකවාදීන් මෙන් ම සංශයවාදීන් ද විමුක්ති මාර්ගයක් අනුගමනය කළ බව යි.[15] එමෙන් ම උත්තරධ්‍යයන සූත්‍රයට අර්ථ විවරණ සපයන ජැකෝබ් දක්වා ඇත්තේ, සංශයවාදීන් විමුක්තිය සඳහා ඥානය අවශ්‍ය කාරණයක් ලෙස නොසැලකූ නමුත් තපසෙහි දී එය අවශ්‍ය යැයි සැලකූ බව යි.[16] අනෙක් අතට සාක්ෂ්‍ය සහිත ඥාන විභාගය මත පදනම් වූ විමුක්ති මාර්ගයක් අවධාරණය කළ බවට පිළිගත හැකි සාධක පෙළ සාහිත්‍යයෙන් හමු නො වෙතත්, එවැනි මාර්ගයක් අනුගමනය කරන්නට ඇතැයි සිතීම මූලික කරුණු සමඟ විසංවාදී නොවේ. තම සංශය පහසුකර ගැනීම සඳහා ඔවුන් භාවිත කළ පංචභංගී නය අනුව භාරතීය සමාජය තුළ අමරාවික්ඛේපවාදීන් කෙතරම් තාර්කික ශක්‍යතාවයක සිටියේදැයි යන්න සනාථ කරන වැදගත් සාධකයකි. සමස්ත කරුණු දෙස අවධානය යොමු කරන විට මෙම පිරිස සෛද්ධාන්තික මට්ටමක පිහිටි බුද්ධිමය සංශයවාදයක් ගොඩනගා ගෙන සිටි බව පෙනේ. එහි පදනම යහපත් ජීවන ප්‍රතිපදාවක් මත සාක්ෂ්‍ය සහිත ඥාන විභාගයක් සඳහා තමන්ට ආවේණික ක්‍රම විද්‍යාවක් සකසා ගැනීම අතින් සෙසු භාරතීය චින්තන කණ්ඩායම් අතර කැපී පෙනෙන කරුණකි.

**බෞද්ධ මූලාශ්‍රය අනුව විග්‍රහ වන භාරතීය සංශයවාදී ගුරුකුලයේ සදාචාරාත්මක අංශය**

බෞද්ධ මූලාශ්‍රය ඇසුරෙන් භාරතීය සංශයවාදය පිළිබඳ තොරතුරු අනාවරණය කර ගැනීමේ දී මහත් වූ ආලෝකයක් සපයන වැදගත් ම බෞද්ධ මූලාශ්‍රය වන්නේ බ්‍රහ්මජාල සූත්‍රය යි. අර්ථජාල (අත්ථජාල) ධර්මජාල, බ්‍රහ්මජාල, දෘෂ්ටිජාල[17] ලෙස නම් කෙරෙන මෙම දෙසැටක් චින්තන දෙපරිදි වන්නේ දහ අටක් වූ පූර්වාන්ත කල්පික අදහස් හා සතළිස් සතරක් වූ අපරාන්ත කල්පික අදහස් ලෙස වන අතර අමරාවික්ඛේපිකවාදී ගුරුකුල සතර ගැනෙන්නේ පූර්වාන්ත කල්පික කොටසෙහි ලා ය.[18] පාලි මූලාශ්‍රයවල සංශයවාදය හැඳින්වෙන අමරාවික්ඛේපිකා[19] යන්න පිළිබඳ තවදුරටත් ගවේෂණය කළහොත් මේ සඳහා

භාවිත වූ තවත් පාරිභාෂික වචන දෙකක් 'වාචාවික්ඛේප'[20] (වාචාවික්ඛේප) හා 'අවිරුද්ධකතා'[21] යනුවෙන් වචන දෙකක් දැක්විය හැකි යි. වචනයෙන් වික්ෂේපයට පැමිණීම හෝ පමුණුවාලීම වාග්වික්ෂේපයෙන් හෙවත් වචාවික්ෂේපයෙන් අදහස් කෙරෙන අතර කිසිදු අදහසකට විරුද්ධ නො වීම, ගැටුම් ඇති කර නො ගැනීම, අවිරුද්ධකතා යන්නෙන් අදහස් කෙරේ. කෙසේ නමුත්, පෙළ සාහිත්‍යයේ සංශයවාදය සඳහා යෙදෙන සුප්‍රකට වචනය වනුයේ, අමරාවික්ඛේපිකා යන්න යි. බ්‍රහ්මජාල සූත්‍රය පෙන්වා දෙන ආකාරයට සංශයවාදීන් මූලික වශයෙන් ම පෙන්වා දුන් දෝෂ සතරක් සැලකිල්ලට ගන්න අතර එම දෝෂ පෙන්වා දෙන ආකාරය අනුව ඔවුන් ගුරුකුල සතරක් ලෙස බෙදා දැක්විය හැකි ය. එනම්,

1. මුසාවාදය ප්‍රතික්ෂේප කළ පිරිස
2. උපාදානය ප්‍රතික්ෂේප කළ පිරිස
3. අනුයෝගය ප්‍රතික්ෂේප කළ පිරිස
4. අඥානකත්වය මත සංශය භාවිත කළ පිරිස යනුවෙනි.

සමස්තයක් ලෙස මෙම සංශයවාදී චින්තන කණ්ඩායම් සතර ම යම් ඥානයක නිශ්චිතතාව සඳහා වන කරුණු හරි හැටි දැන ගැනීමට නො හැකි වන කළ එවැනි ඥානයක් පිළිගැනීමෙන් අසතුටු දායක හෙවත් නුසුදුසු මනෝවිද්‍යාත්මක හා සදාචාරාත්මක දුෂ්කරතා පිළිගත් බව හා ඇතැම් විට අවධාරණය කර ඇති බව පෙනේ. ඥානයෙහි දුෂ්කරතා මත පදනම් වී විනිශ්චයක් ලබා දීම සඳහා මනෝවිද්‍යාත්මක හා සදාචාරාත්මක අංශයන්ගේ උපයෝගීතාව සැලකිල්ලට ගත් ආකාරය අනුව මෙම සංශයවාදී සිව් පිරිස කොටස් දෙකකට වෙන් කළ හැකි බව පෙනේ. එනම්,

1. සදාචාරාත්මක හා මනෝවිද්‍යාත්මක අංශයන් කෙරේ නැඹුරුව සංශයවාදය ඉදිරියට ගෙන ගිය පිරිස
2. සදාචාරාත්මක හෝ මනෝවිද්‍යාත්මක අංශවලටත් වඩා අඥානකම පාදක කොට ගෙන සංශයවාදය ඉදිරියට ගෙන ගිය පිරිස, යනුවෙනි.

ඉහතින් දැක්වූ සංශයවාදී සිව්පිරිසෙන් පළමු කණ්ඩායම් තුන මෙහි පළමු පිරිසට අයත් වන අතර අවසාන කණ්ඩායම මෙහි දෙවැනි පිරිසට අයත් වේ.

❖ මුසාවාදය ප්‍රතික්ෂේප කළ පිරිස - බ්‍රහ්මජාල සූත්‍රය පෙන්වා දෙන පරිදි අමරාවික්ඛේපවාදී ගුරුකුල අතර මෙම ගුරුකුලය සදාචාරාත්මක හා මනෝ විද්‍යාත්මක අංශයන් කෙරේ නැඹුරුව සංශයවාදය ඉදිරියට ගෙන ගිය එක් කණ්ඩායමකි. සප්‍රමාණ (වලංගු) සාක්ෂ්‍යවලින් තොර ව යම් ප්‍රස්තුතයක් අප සත්‍ය යැයි පිළිගතහොත් ඊට කැමති වන හෝ පක්ෂපාතී වන (ඡන්දො, රාගො) මානසික ස්වභාවයක් ද එසේ නැතහොත් ඊට ප්‍රතිවිරුද්ධ වීම කෙරෙහි අකමැති වන හෝ පක්ෂපාතී නො වන මානසික ස්වභාවයක් ද අප තුළ ඇති වේ. ප්‍රස්තුතයක් සත්‍ය වශයෙන් ගැනීමට හෝ එය වැරදි සහගත අසත්‍ය

(මායා) වශයෙන් පිළිගැනීමට හෝ කෙනෙකු පොළඹවන්නේ මෙම චෛතසික ස්වභාවය යි. මෙහි ප්‍රතිඵලය වන්නේ අසත්‍ය වූ ප්‍රකාශ සිදු කිරීම හා වැරදි දේ කිරීම (විඝාතො) වන බැවින් එය සදාචාරාත්මක වශයෙන් මහත් හානි ගෙනදෙන්නක් වේ.[22] මේ අනුව මෙම සංශයවාදීන් ප්‍රධාන කරුණු දෙකක් කෙරේ සිය අවධානය යොමු කර ඇත. එයින් එකක් නම් එදිනෙදා ජීවිතයේ දී දන්නා කරුණු අනුව යමින් නොදන්නා දේ පිළිබඳ උපකල්පන ගොඩනගන්නේ ගවේෂණය, විමර්ශනය තුළින් සාක්ෂ්‍ය සහිත වූ ඥානයක් ලබා ගැනීමේ අසීරු කටයුත්ත පහසු කර ගැනීමට යි. නමුත් අප යමක් පිළිබඳ කරුණු හරි හැටි අවබෝධ කොට නො ගෙන පිළිගැනීම හෝ නො පිළිගැනීම සිදු කරන්නේ නම්, එය නිවැරදි වීමේ ඇති හැකියාව සම්භාවිතාවක් මිස අනිවාර්ය වුවක් නොවේ. ඇතැම් විට කැමැත්ත අනුව ගත් උපකල්පන, නිගමන මුළුමනින් ම සාවද්‍ය විය හැකි ය. යම් හෙයකින් එබඳු නිගමනයක් අසත්‍ය බව වැටහුණහොත් අප කනස්සල්ලට පත් වේ. මේ තත්ත්වය වළකාලමින් සත්‍ය රහිත ව යම් කරුණක් පිළිබඳ මෙහෙය වන බුද්ධිමය ඥානය අසත්‍ය හෙවත් මුසාවක් වීමට ඇති ඉඩකඩ නිසා ම මුසාවාදයට බිය වී (මුසාවාද භයා)[23] මුසාවාදය පිළිකුල් කිරීම (මුසාවාද පරිජෙගුච්ඡා)[24] මෙම සංශයවාදීන්ගේ විශේෂ ලක්ෂණය යි.

දෙවැනි කරුණ නම්, නො දැනීම මත වුවත් යම් කරුණක් අපගේ කැමැත්ත අනුව මුදුන් පත් කර ගැනීමේ දී ඡන්දය (ඡන්දො) රාගය (රාගො) ද්වේශය (දොසො) හා පටහැනි බව (පටිඝ)[25] යනාදී මානසික කරුණු නැතහොත් ආත්මීය පදනමකින් එය විකෘතියට පත්වීම වැළැක්විය නො හැක්කකි. මුසාව පදනම් කොට ගෙන යම් විනිශ්චයකට එළඹීම ප්‍රතික්ෂේප කළ මෙම සංශයවාදී පිරිස මෙන් ම අනෙක් පිරිස් ද මධුපිණ්ඩික සූත්‍රයේ මෙම අදහසට එකඟ වන බව පෙනේ.

❖ උපාදානය ප්‍රතික්ෂේප කළ පිරිස - පෙළ සාහිත්‍ය තුළ උපාදානය යන්න යෙදී ඇත්තේ දැඩි ගැනීම නැතහොත් දැඩි ලෙස අල්ලා ගැනීම[26] යන අරුත් විශද කිරීම සඳහා ය. පක්ෂග්‍රාහී බව හෝ විරුද්ධතාවය තුළ එල්බ ගැනීම උපාදානය ලෙස ගැනීම[27] වඩාත් යෝග්‍ය වේ. බුදු සමයේ උපාදානය විග්‍රහ කරනුයේ නිර්වාණගාමී මාර්ගයට බාධා පමුණුවන හා පුද්ගලයා භවගාමී වීම කෙරෙහි මුල් වන (උපාදාන පච්චයා භවො)[28] ග්‍රහණයක් ලෙස යි. මේ බව අලගද්දූපම සූත්‍රයේ උපාදානය දෙපරිදි කොට ගහණ උපාදානය යටතේ කාම, දිට්ඨි, සීලබ්බත හා අත්තවාද යනාදී වශයෙන් කරුණු සතරක් ද, පච්චය උපාදානය යටතේ අවිජ්ජා පච්චයා සංඛාරා යනාදී වශයෙන් ප්‍රත්‍ය ද ගෙනහැර දක්වා තිබෙන ආකාරයෙන් පැහැදිලි වේ.[29] මේ අනුව අමරාවික්ඛේපවාදීන් සසර පැවැත්මක් නොහොත් මීළඟ භවයක් විශ්වාස කළ බව සිතීම අතාර්කික යි. එහෙත් කේ. එන්. ජයතිලක මහතා ශිලාංකගේ විස්තර කථනය අනුව යමින් පෙන්වා දෙන්නේ උපයෝගීතා පදනමකින් අමරාවික්ඛේපවාදීන් ස්වර්ගය පිළිගැනීම ද ප්‍රතික්ෂේප කළ බව සිතිය නො හැකි බව යි.[30] පක්ෂග්‍රාහී ආකල්පයක් වෙත යොමු වුවහොත් එයින් මතුවන්නා වූ අවුල සදාචාරාත්මක වශයෙන් සැලකිල්ලට ගෙන නො නැවතුණු මෙම අමරාවික්ඛේපවාදීහු එහි බලපෑම මානසික වශයෙන් පශ්චාත්තාපයට, කණගාටුවට හේතු වන බව මනෝවිද්‍යාත්මකව ද සලකා බලා උපාදානයට බියෙන් (උපාදානභයා)[31] උපාදානය ප්‍රතික්ෂේප කළහ.

(උපාදාන පරිජෙගුච්ඡා)[32] යමක් තමන්ට උපාදානයක් වන්නේ, නම් (මමස්ස උපාදානං) එය තමන්ට දුකක් ද (සො මමස්ස විඝාතො) අවැඩක් නොහොත් බාධාවක් ද (සො මමස්ස අන්තරායො) වන්නේ ය,[33] යන මොවුන්ගේ අවධාරණය යම්තාක් දුරකට ධම්මපදයේ සඳහන් වන 'යම් කර්මයක් කොට පශ්චත්තාප වීමටත්, කඳුළු වැගිරීමටත් සිදුවේ නම් එබඳු කර්ම සිදු නො කළ යුතු ය'[34] යන ප්‍රකාශයත් සමඟ සමාන බව පෙනේ.

❖ අනුයෝගය ප්‍රතික්ෂේප කළ පිරිස - විවිධ මතිමතාන්තර පිළිබඳ ඥානයක් ඇතැයි කියුවන් හා ඒවා විශ්වාස කළ වූවන් ඔවුනොවුන් කළ විවාද කරණ කොට ගෙන ඇති වන්නා වූ මනෝවිද්‍යාත්මක හා සදාචාරත්මක හානිකර ප්‍රතිවිපාක කෙරේ මෙම සංශයවාදී පිරිස අවධානය යොමු කළ බව පෙනේ.[35] තමන්ට තහවුරු කිරීමට ස්වමතයක් නැති විට කෘතහස්ත තාර්කිකයන්ගේ තර්කාභාස චෝදනා එල්ල නොවනු ඇත.[36] විවාදයක නිෂ්ඵල බව පමණක් නොව, එයින් පරාජය වීමෙන් ඇති වන මානසික පශ්චාත්තාපය අතිශය හානිකර බව සලකා බැලූ මොවුන් අනුයෝගයට බිය වී (අනුයෝග භයා)[37] එය පිළිකුල් ලෙස ප්‍රතික්ෂේප කර ඇත. (අනුයෝග පරිජෙගුච්ඡා)[38]

❖ අඥානකත්වය මත සංශයවාදය භාවිත කළ පිරිස - ඉහතින් සාකච්ඡා කළ අමරාවික්ඛේපවාදී චින්තන කණ්ඩායම් තුනට වඩා බෙහෙවින් වෙනස් මෙම පිරිස බ්‍රහ්මජාල සූත්‍රයට අනුව සදාචාරාත්මක හා මනෝවිද්‍යාත්මක අංශ කෙරේ අවධානය යොමු කොට නැත. (**ඉධ.... ඒකච්චො සමණොවා බ්‍රහ්මණොවා මන්දො හොති මොමුහො. සො මන්දත්තා මොමුහත්තා තත්ථ තත්ථ පඤ්හං පුට්ඨො සමානො වාචාවික්ඛේපං අපජ්ජති අමරාවික්ඛේපං)**[39] අනුවණ ඇතැම් මහණ බමුණෙන් ද වේ. ඔහුගේ මෙම අනුවණභාවය නිසා ම යම් ප්‍රශ්නයක් විමසූ විට නිරර්ථක වචන හරඹයකින් එම ප්‍රශ්නයෙන් ලිස්සා පලා යයි, යන්න මෙහි අරුත යි. බ්‍රහ්මජාල සූත්‍රයේ සිව්වැනි ව දක්වෙන මෙම අමරාවික්ඛේපවාදී ගුරුකුලය පිළිබඳ විස්තරය තුළින් ථෙරවාදී ත්‍රිපිටකය එක් වැදගත් නිගමනයකට පැමිණෙන බව කිව යුතු ය. එනම්, මෙම අමරාවික්ඛේපවාදී ගුරුකුලය පිළිබඳ විස්තරයට සමාන්තර ව යන සාමඤ්ඤඵල සූත්‍රය මෙම චින්තන කණ්ඩායමේ නායකයා ලෙස හෝ එහි සාමාජිකයෙක් ලෙස වෛරාටිපුත්‍ර සංජය ගෙනහැර දක්වා ඇති බව යි. මේ අනුව මෙම අමරාවික්ඛේපවාදී ගුරුකුලය පිළිබඳ කෙරෙන විස්තර කථනය තුළ සංජය බෙල්ලට්ඨිපුත්ත කෙරේ ද අවධානය යොමු විය යුතු බව පෙනේ.

සංජයගේ සංශයාත්මක අභිරුචිය ඥානය පිළිබඳ සමස්ත ක්ෂේත්‍රය පුරාවට ම ව්‍යාප්ත වූ බව පෙනේ. විශේෂයෙන් ම සත්‍යාක්ෂණය කළ නොහැකි මරණින් මතු පැවැත්ම ආදී අධිභෞතික කරුණු හා හොඳ, නරක ආදී ආචාර විද්‍යාත්මක කරුණු කෙරේ ඔහුගේ අවධානය යොමු වී ඇත. ප්‍රස්තුතවල සත්‍යතා අගය ප්‍රාමාණික සාක්ෂ්‍ය මත පදනම් වෙමින් සලකා බැලූ සංජය ග්‍රීක දර්ශනයේ විතණ්ඩවාදියෙක් සේ සංශය මෙහෙය වූ බව පෙනේ. එමෙන් ම ඥානය පිළිබඳ ඔහුගේ විචාර ප්‍රාථමික මට්ටමින් පෙනුන ද එය අවබෝධ කොට ගත යුත්තේ සමකාලීන චින්තකයන්ගේ ඥාන ගවේෂණය සමඟ තුලනාත්මක ව

ය. දැනට හමු වන තොරතුරුවලට අනුව සංජය සාක්‍ෂ්‍ය සහිත කරුණු කෙසේ වෙතත් සාක්‍ෂ්‍ය රහිත, සත්‍යාක්‍ෂණය කළ නො හැකි කරුණු විමසන විට පිළිතුරු ලබා දීමේ දී තරමක් දියුණු ක්‍රමවේදයක් භාවිත කර තිබේ. එය පංචවිධ හෝ පංචකෝටික හෝ පංච භංගී නය හෙවත් තර්කණ ක්‍රමයකි. එනම්,

**01. ඒවම්පි මෙ නො - මම එසේ නොකියමි.**

**02. තථාතිපි මෙ නො - මම මෙසේ නොකියමි.**

**03. අඤ්ඤථාතිපි මෙ නො - මම අන් ලෙසකිනිදු නොකියමි.**

**04. නොතිපි මෙ නො - මම නැතැයි ද නොකියමි.**

**05. නො නොතිපි මෙ නො - මම නැත නැතැයි යනුවෙන් ද නොකියමි.**[40]

දීඝනිකාය අටුවාවට අනුව මෙම පංචභංගී නයෙහි එක් එක් ප්‍රස්තුත කෙරෙන් අපේක්ෂා කරන ලද අරමුණු ද වේ. ඒවා මෙසේ දැක්විය හැකි ය.

| ***ප්‍රස්තුතය*** | ***අභිප්‍රාය*** |
|---|---|
| ඒවම්පි මෙ නො | අනියාමිත වික්ඛේපො<br>නොමෙහෙය වන ලද වික්ෂේපය ඇති කිරීම. |
| තථාතිපි මෙ නො | ශාස්වතවාදය නිශේධනය කිරීම / ආත්මය ද ලෝකය ද ශාස්වතය, යන්න ප්‍රතික්ෂේප කිරීම. |
| අඤ්ඤථාතිපි මෙ නො | ඒකච්ච ශාස්වතවාදය ප්‍රතික්ෂේප කිරීම / නිත්‍යතා මතයෙන් වෙනස් (අඤ්ඤථා) අර්ධ නිත්‍යථා මත (ඒකච්ච සස්සතං) ද ප්‍රතික්ෂේප කිරීම. |
| නොතිපි මෙ නො | උච්ඡේදවාදය ප්‍රතික්ෂේප කිරීම / පුද්ගලයා මරණින් මතු නැත, යන මතය ප්‍රතික්ෂේප කිරීම. |
| නො නොතිපි මෙ නො | තර්කවාදය ප්‍රතික්ෂේප කිරීම / පුද්ගලයෙකු මරණින් මතු පවතින්නේ ද නොපවතින්නේ ද නොවේ යන්න නිශේධනය කිරීම.[41] |

කිසිසේත් සත්‍යාක්‍ෂණ කළ නො හැකි හෝ සත්‍යාක්‍ෂණය කළ හැකි නමුත්, එසේ කිරීමෙන් ඵලක් නැති හෝ සත්‍යාක්‍ෂණය කළ හැකි නමුත්, තවමත් සිදු නොකළ යමක් පිළිබඳ විය හැකි යැයි සැලකිය හැකි මෙම භව්‍යතා සංජය මෙන් ම අනෙක් සංශයවාදී ගුරුකුල තුන ද භාවිත කර ඇති බව පෙනේ. සංජයගේ අමරාවික්ඛේපවාදය පිළිබඳ අටුවාව ගෙනහැර දක්වන තොරතුරු අනුව සංජය පමණක් නොව අමරාවික්ඛේපවාදී සිව් ගුරුකුලය ම ඉහත කී පංචභංගී නය භාවිත කර ඇත්තේ තමන් කිසිදු ආකාරයක අන්තවාදයක් නො දරන බව ප්‍රකට කිරීමට බව පෙනේ.

**බෞද්ධ චතුෂ්කෝටිකය**

උභයාන්ත තර්ක ක්‍රමය ඉක්මවා යන තර්ක ක්‍රම පිළිබඳ යුරෝපීය අත්දැකීම්වලින් වෙනස් භාරතීය බහු අන්ත තර්ක ක්‍රම පිළිබඳ නිදසුන්වල දී ජෛනයන්ගේ සප්තභංගී ක්‍රමය හැරුණු විට සංශයවාදීන්ගේ පඤ්චාකාර තර්ක ක්‍රමයට ලැබෙන්නේ වැදගත් තැනකි. ජෛනයන් සිය සප්තභංගී නය භාවිත කර ඇත්තේ අනේකාන්තවාදය හෙවත් සත්‍යය හෝ යථාර්ථය එක් ආකාර ප්‍රස්තුතයකින් පමණක් මුළුමනින් ප්‍රකාශ කළ නො හැකි ය, යන විශ්වාසයෙනි.[42] ඉහත කී ආකාරයට සංශයවාදියා ප්‍රස්තුත පහ ප්‍රතික්ෂේප කරන නිසා ජෛන තර්කිකයාගෙන් පැහැදිලි ව වෙනස් වෙයි. මෙම ක්‍රම දෙකෙන් ම බෞද්ධ චතුෂ්කෝටිකය කෙරේ ඇති සබඳතාවය ද විමසා බැලිය හැකි ය. ත්‍රිපිටක ධර්මයෙහි මෙන් ම පශ්චත්කාලීන සාහිත්‍යයෙහි ද සඳහන් විවිධ විෂය යටතෙහි දක්වා ඇති නිදසුන් එක ම ආකාරයකින් දැක්වීම දුෂ්කර වුවත්, චතුෂ්කෝටි ප්‍රස්තුතවල ස්වරූපය පැහැදිලි කිරීම සඳහා පහත සඳහන් නිදසුන දැක්විය හැකි ය.

01. පරලොව පවතී.
02. පරලොව නො පවතී.
03. පරලොව පවතී, එමෙන් ම නො පවතී.
04. පරලොව පවතින්නේ ද නොවේ, නො පවතින්නේ ද නොවේ.[43]

ඉහත සම්ප්‍රදාය දෙකෙන් බෞද්ධ චතුෂ්කෝටියේ විශේෂත්වය වන්නේ මේ තුළ සැමවිට ම එක් ප්‍රස්තුතයක් පමණක් සත්‍ය වන බව පෙන්වා දීමෙනි. ප්‍රස්තුත සතර ප්‍රතික්ෂේප කරනුයේ අධිභෞතික යැයි සැලකෙන විෂය සම්බන්ධයෙන් පමණි.[44]

බුදුදහම චතුෂ්කෝටික නය හුදෙක් භාෂා මෙවලමක් ලෙස සලකා ඇත්තේ උපයෝගිතා පදනමකින් නිසා පරිපූර්ණ සත්‍ය ප්‍රකාශක වාහකයක් ලෙස එය උපයුක්ත කර ගැනීම සම්බන්ධයෙන් සඳහනක් කිසිදු තැනක දක්නට නොමැත. මෙහි දී අපගේ මෙම කාර්යයට චතුෂ්කෝටික තර්ක ක්‍රමය සැලකිල්ලට භාජනය වනුයේ මෙමගින් බුදුදහම සාරවාදය ***(Essentialism)*** හා ඒකාන්තවාදය ***(Abosolutism)*** ප්‍රතික්ෂේප කරන බැවින් එම සංකල්ප මත පදනම්ව ඇති සත්‍ය හා අසත්‍ය යන ද්වාවිධකරණයන් යුතු තර්ක ක්‍රමය ද බැහැර කරන අකාරය පෙනී යන නිස යි. බුදුදහමේ මධ්‍යම ප්‍රතිපදාව ඉදිරිපත් කිරීමට නාගාර්ජුන පාදයන් රචනා කරන **මූලමාධ්‍යමික කාරිකාවේ** ද චතුෂ්කෝටික තර්ක ක්‍රමය භාවිත වන්නේ මෙම අන්තවාද බැහැර කිරීම උදෙසා බව සිතිය හැකි ය. ක්වොන්ටම් භෞතික විද්‍යාවේ ක්ෂුද්‍ර අංශුවක ගම්‍යතාව නිගමනය කිරීමේ දී චතුෂ්කෝටියේ එන ප්‍රකාශනවලට සමාන වූ ප්‍රකාශන උපයෝගී කරගනියි. මෙයින් පෙනෙනුයේ නිරපේක්ෂක ප්‍රකාශන සහිත ද්විකෝටිකයට වඩා සාපේක්ෂක ප්‍රකාශන ඉදිරිපත් කරන චතුෂ්කෝටික ප්‍රකාශ යථාර්ථයට වඩාත් ළං වන බව යි.[45] මේ සම්බන්ධයෙන් අදහස් දක්වන මහාචාර්ය, නලින් ද සිල්වා පෙන්වා දෙන්නේ ද්විකෝටිකය යනු ආත්මවාදය පදනම් කොටගත් න්‍යායක් බව යි. ''වස්තුවක පැවැත්ම, ධර්මයක පැවැත්ම ආදිය ඊනියා යථාර්ථයක් ලෙස එහි දී

සැලකේ. චතුෂ්කෝටික න්‍යාය එක් අතකින් ගත් කළ අනිත්‍ය හා අනාත්ම මනසට දැනෙන ආකාරයට ප්‍රකාශ කිරීම සඳහා සැකසී ඇත. එය මනසට දැනෙන ආකාරයට යනුවෙන් සඳහන් කරන්නේ, මනස යන්නට නිත්‍ය ය, සුඛ, අත්ම, අනවබෝධය නිසා නිර්මාණය කෙරෙන්නක් වන බැවිනි. චතුෂ්කෝටිකය වුව ද නිවන සඳහා නොව පෘථග්ජනයන් වූ අප සඳහා ය. අපගේ සාමාන්‍ය ජීවිතයේ දී පුටුව වැනි දැහි අනාත්මවාදී පැවැත්ම පදනම් කර ගනිමින් කටයුතු කිරීමට චතුෂ්කෝටිය ප්‍රමාණවත් වෙයි. එහෙත් පුටුව පමණක් නොව සිත ද වෙනස් වන බව තේරුම් ගැනීමේ දී (චලිතය වෙනස් වීමේ එක් ක්‍රමයක් එක් මානයක් *(mode)* පමණකි.) ද්විකෝටිකය ප්‍රමාණවත් නොවේ."[46] කෙසේ වෙතත් තර්කය න්‍යාය සප්‍රමාණ ඥානෝපාය වශයෙන් යොදා ගැනීමේ ඇති උපයෝගීතාව අවම බව බුදුසමයේ අදහස යි.[47]

**සමාලෝචනය (තර්කයයෙන් සැබෑ දානය ලැබීම පිළිබඳ ගැටලුව)**

බුදුරදුන්ට සමකාලීනවත්, ඊට පෙරාතුවත් භාරතයේ සිටි ඇතැම් ආගමික ආචාර්යවරු හා චින්තකයෝ ලෝකය පිළිබඳ නිවැරදි ඥානය තර්කය ඇසුරින් ලැබිය හැකි බව විශ්වාස කළහ.[48] මුල් බුදුසමයට අයත් පෙළ පොත්වල හමුවන *තක්ක, තක්කී, තක්කිකා* යන වචන වලින් ඥානය ලැබීමේ මේ මාර්ගයත්, ඒ මගින් ඥානය ලැබීමට යොමුවුවනුත් හඳුන්වා ඇති බව පෙනේ. අධිකාරය මත පදනම් වූ ඥාන මාර්ගයන් සම්බන්ධයෙන් අනුස්සවය මූලිකත්වය ගන්නාක් මෙන් මෙහි දී මූලිකත්වය ගන්නේ තර්කය යි. අටුවාව *"තක්ක හේතු"* යන්න *"තක්ක ගාහේන"* (තර්කයෙන් තේරුම් ගන්නා, තර්කයෙහි ඇලී ගැලී සිටින) යනුවෙන් අර්ථ දක්වා ඇත.[49] මහාචාර්ය ජයතිලකයන්ට අනුව මෙයින් අදහස් වන්නේ " තර්කය පදනම් කර ගත් මත" යන්න යි.[50] මහාචාර්ය, ජයතිලක පෙන්වා දෙන ආකාරයට පාලි නිකාය තුළ "තක්ක" යන වචනයෙන් දක්වන අදහස පහත දක්වෙන කරුණු දෙකෙන් එකක් විය යුතු ය. එනම්,

- මේ යුගයෙහි විවාදයට ලක් වූ මතවාද තහවුරු කිරීමට හෝ ඒවා විවේචනය කිරීමට ඉවහල් කර ගත් එක්තරා තර්කණ විශේෂයකි. ඒවා හුදෙක් තර්කයෙන් ම උත්පාදනය කරන ලද ඒවා යැ'යි කෙසේවත් සැලකිය නො හැකි ය.
- කාල්පනික බුද්ධිවාදී අධිභෞතික මතයන් ගොඩනැංවීමට ඉවහල් වූ තර්ක විශේෂයකි.[51]

ඇතැම් විද්වතුන් *"තක්කී"* යන්නෙන් අදහස් කර ඇත්තේ විතණ්ඩවාදීන් බවත්, අඥෙයවාදීන් හෝ සංශයවාදීන් ලෙස ද මොවුන් හැඳින්විය හැකි බවත් දක්වා ඇත. මෙම මතයෙහි සිටින ඕල්ඩන්බර්ග් මහතා ග්‍රීක විතණ්ඩවාදීන් සමග සසඳමින් භාරතීය විතණ්ඩවාදීන් වර්ග සයකට (6) බෙදා එහි පළමු පිරිස ලෙස දක්වා ඇත්තේ තමාට ම ස්වීය වූ කිසිදු මතයක් නොමැති ව යම් ප්‍රශ්නයක සෑම පැත්තක් ම සලකා බැලූ අමරාවික්ඛේපවාදීන් හෙවත් සංශයවාදීන් ය.[52] විතණ්ඩවාදීන් සඳහා පෙළෙහි එන *"තක්කී"* යන්න පළමුවෙන් ම භාවිත කර ඇත්තේ විද්‍යාභූෂණ නැමැත්තා ය.[53] ඔහුගේ මතය වන්නේ මේ මගින් අදහස් වන්නේ බෞද්ධ, ජෛන, බ්‍රාහ්මණ යනාදී පිරිස් බව යි. මෙම අදහස කීත් ද පිළිගෙන ඇත. එහෙත් විද්‍යාභූෂණගේ අදහස එතරම් සාධනීය නො වන බව පෙනේ. මහාචාර්ය, ජයතිලක පෙන්වාදෙන ආකාරයට සරල ව මේ මගින් අදහස් වන්නේ තාර්කිකයෙකු යන්න යි. එසේ ම තර්කය පදනම් කරගෙන

අධිභෞතිකවාදී මතයක් ගොඩ නැගීමට තැත් කළ, ඒ සඳහා හුදෙක් තර්කය ම ඉවහල් කරගත් තාර්කිකයන් මේ තුළින් අර්ථවත් කෙරේ. අටුවාවේ දැක්වෙන ආකාරයට තාර්කිකයන් වර්ග හතරකි. එනම්,

- *අනුස්සවිකා තක්කිකා* - ආගමික සාහිත්‍යය, ශ්‍රැති සම්ප්‍රදාය අනුව තර්ක කරන පිරිස
- *ජාතිස්ස තක්කිකා* - පෙර ජාති සිහිකරන නුවණ ලැබ "මම පෙර වූයෙමි" ආදී වශයෙන් තර්ක කරන පිරිස
- *ඣායි තක්කිකා* - කිසියම් ධ්‍යාන ඵලයක් ලැබ ඒ අනුව තර්ක කරන පිරිස
- *සුද්ධ තක්කිකා* - තර්ක මාත්‍රය ම ගෙන ඒ අනුව තර්ක කරන පිරිස[54] යනාදිය යි.

බ්‍රහ්මජාල සූත්‍රයේ සඳහන් දෙසැටක් වන වාද අතරින් තාර්කිකයන් ගෙනහැර දැක් වූ වාද හතරකි. ඒවා මෙහි ඉහතින් සඳහන් කළ තාර්කිකයන් සිව් පිරිසෙන් ශුද්ධ තාර්කිකයන්ගේ ම වාද බව පෙනේ.[55]

තර්කයෙහි ස්වභාවය අනුව යම් මතවාදයක සත්‍යාසත්‍යතාව පිළිබඳ ඥානයක් ලබා ගැනීමක් අපේක්ෂා කළ නො හැකි ය. මේ අනුව කෙනෙකු යම් මතයක් තර්කය පදනම් කර ගෙන නො පිළිගත යුතු බව පෙනේ. මේ අනුව බුදුසමය ද තර්කයෙහි පවත්නා ඌනතා රැසක් කෙරේ අවධානය යොමු කර ඇති බව පෙනේ. ඒවා නම්,

- තර්කය තාර්කියාගේ පෞද්ගලික හැකියාව හෝ නො හැකියාව මත රඳා පවතින්නක් වීම.
- තර්කයේ මාධ්‍යය වූ භාෂාව හුදෙක් චිත්ත නිර්මිත අවිද්‍යා ජනිත සම්මුතියක් වීම.
- තර්කය මගින් සත්‍ය බහුත්වයක් නිර්මාණය වීම.
- තර්කය අන්තවාදී දෘෂ්ටිගතයනට එළඹීමට මගපාදා දෙනු ලැබීම.
- තර්කය නිසා ද්වේශය, වෛරය හා කළකෝලාහල හට ගැනීමට ඇති ඉඩ කඩ.
- තර්කයේ ඇති අවිනිශ්චිත ස්වභාවය.
- සත්‍යය ඉස්මතු කරලීමේ අව්‍යාජ අරමුණින් බැහැර ව, පටු අරමුණු ඇති ව තර්ක කරන්නන් දක්නා ලැබීම,[56] යනාදිය යි.

ඉහත කී කරුණු පැහැදිලි වන තැනක් ලෙස සන්දක සූත්‍රයේ තර්කය පිළිබඳ විග්‍රහය හඳුන්වා දිය හැක. එහි දී තර්කය හා මත පදනම් වූ ආගම් අවශ්‍යයෙන් ම අසත්‍ය නො වූව ද අසතුටුදායක වන බව දක්වයි. තාර්කිකයෙකු වන යම් ඇදුරෙකු විසින් ඉදිරිපත් කරන ලද යම් මතයක් ඇතැම්විට හොඳින් තර්ක කරනු ලැබූවක් විය හැකි ය. ඇතැම්විට හොඳින් තර්ක කර ඉදිරිපත් කරනු ලැබූවක් නො විය හැකි ය. එය සමහර විට සත්‍ය විය හැකි අතර සමහර විට අසත්‍යය විය හැකි ය.[57] මේ අනුව බලන විට තර්කයෙන් බැස ගන්නා නිගමන සතරාකාර විය හැකි බව පෙනේ. එනම්,

1. ***සුතක්කිතං තථා*** - **නිවැරදි ව තර්ක කළ මෙන් ම සත්‍ය වූ**
2. ***සුත්තකිතං අඤ්ඤථා*** - **නිවැරදි ව තර්ක කළ එහෙත් අසත්‍ය වූ**
3. ***දුතක්කිතං තථා*** - **වැරදි ව තර්ක කළ එහෙත් සත්‍ය වූ**
4. ***දුත්තක්කිතං අඤ්ඤථා*** - **වැරදි ව තර්ක කළ මෙන් ම අසත්‍ය වූ** යනාදිය යි.

මේ අනුව තර්කයෙන් යම් මතයක් තහවුරු කළ පමණින් එය සත්‍ය යැයි පිළිගත නො හැකි අතර එය වැරදී යාමට වුවත් ඉඩ කඩ පවතී. වැරදි යැ'යි ඉවත දමන ලද මතයක් ඇතැම් විට සත්‍ය වීමට ද ඉඩක ඇත. මේ අනුව ඥානයේ සප්‍රමාණ අගයක් තර්කයට ලබා දිය නො හැකි බව පෙනේ.

තර්කය හා ඥානය අතර ස්වභාවයෙහි යථාර්ථානුපී පදනම සංශයවාදී චින්තනය ද බුදුදහම ද අවබෝධ කරගෙන ඒ අනුව චින්තනය මෙහය වූ බව කිව යුතු ය. සත්‍යෝක්ෂණය කළ නො හැකි මරණින් මතු පැවැත්ම ආදී අධිභෞතික කරුණු හා හොඳ, නරක ආදී ආචාර විද්‍යාත්මක කරුණු කෙරේ සංජයගේ අවධානය යොමු වී ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස පංචකෝටික නය හෙවත් පංචකෝටික තර්ක ක්‍රමයක් භාවිත වූ බව පෙනේ. දීඝනිකාය අටුවාවට අනුව මෙම පංචභංගී නයෙහි එක් එක් ප්‍රස්තුත කෙරෙන් අපේක්ෂා කරන ලද අරමුණු ද වේ. කිසිසේත් සත්‍යාක්ෂණ කළ නො හැකි හෝ සත්‍යාක්ෂණය කළ හැකි නමුත්, එසේ කිරීමෙන් ඵලක් නැති හෝ සත්‍යාක්ෂණය කළ හැකි නමුත්, තවමත් සිදු නො කළ යමක් පිළිබඳ විය හැකි යැයි සැලකිය හැකි මෙම භව්‍යතා සංජය මෙන් ම අනෙක් සංශයවාදී ගුරුකුල තුන ද පංචභංගී නය භාවිත කර ඇත්තේ තමන් කිසිදු ආකාරයක අන්තවාදයක් නොදරන බව ප්‍රකට කිරීමට බව පෙනේ. අමරාවික්ඛේපවාදීන්ගේ පංචභංගී නයෙන් බෞද්ධ චතුෂ්කෝටියේ විශේෂත්වය වන්නේ ප්‍රස්තුත සතර අතරින් සැමවිට ම එකක් පමණක් සත්‍ය වන බව පෙන්වා දීමෙනි. ප්‍රස්තුත සතර ප්‍රතික්ෂේප කරනුයේ අධිභෞතික යැ'යි සැලකෙන විෂය සම්බන්ධයෙන් පමණි. බුදුදහම චතුෂ්කෝටික නය හුදෙක් භාෂා මෙවලමක් ලෙස සලකා ඇත්තේ උපයෝගිතා පදනමකින් නිසා පරිපූර්ණ සත්‍ය ප්‍රකාශක වාහකයක් ලෙස එය උපයුක්ත කර ගැනීම සම්බන්ධයෙන් සඳහනක් කිසිදු තැනක දක්නට නොමැත. බුදුදහම සාරවාදය හා ඒකාන්තවාදය ප්‍රතික්ෂේප කරන බැවින් එම සංකල්ප මත පදනම් ව ඇති සත්‍ය හා අසත්‍ය යන ද්වාවිධකරණයන් යුතු තර්ක ක්‍රමය ද බැහැර කරන අකාරය පෙනී යයි. අන්තවාදයකට නො වැටී, අන්තවාදවල නො ගැටී දාර්ශනික මධ්‍යස්ථතාව පිළිබිඹු කිරීම අතින් බෞද්ධ චතුෂ්කෝටිකය හා අමරාවික්ඛේපවාදීන්ගේ මෙම පංචකෝටික නය සමානත්වයක් පිළිඹිබු කරන අතර එම අගය සදාචාරාත්මක වශයෙන් ද ඇගයීමට ලක් කරන විට බෞද්ධ චතුෂ්කෝටික පදනම තවදුරටත් විශේෂ වන්නේ එයින් ගැඹුරු ආධ්‍යාත්මික පදනමක් ද අවධාරණය වන බැවිනි.

**ආන්තික සටහන්**

1. තිලකරත්න, අසංග., *බෞද්ධ චතුෂ්කෝටි තර්ක ක්‍රමයෙහි අර්ථය කුමක් ද?*, ප්‍රසාදිනී, කන්දෙගෙදර ශ්‍රී සුමනවංශ මහ නා හිමි ශාස්ත්‍රීය උපහාරය, සංස් ඃ විමලසාර හිමි නෙළුම්දෙණියේ, සංස්කාරක ප්‍රකාශනයකි, 1995, පි. 82.
2. තිලකරත්න, අසංග., *ශූන්‍යතාවාදයෙහි දර්ශනය හා චරණය*, පි. 36.
3. *එම,* පි.36.
4. *එම,* පි. 36.

5. *එම,* පි. 37.

6. පෙරේරා, එම්, තිලකා., *උද්ගාමී හා නිගාමී තර්ක ශාස්ත්‍රය*, ප්‍රකාශක : ලක්ෂ්මන් මුදන්නායක, 1990, පි. 108-109.

7. ඉලංගකෝන්, සමන්ත., *චින්තන ධාරා*, සමන්ති පොත් ප්‍රකාශකයෝ, ජා-ඇල, 2007, පි. 26.

8. කරුණාසිංහ, මුදිතා., *චීන දර්ශනය*, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10, 2010, පි. 39.

9. *එම,* පි. 39.

10. ජයතිලක කේ. එන්, මුල් බුදු සමයේ ඥාන විභාගය, පි. 152.

11. එම, පි. 153.

12. එම, පි. 144.

13. ජෛන ධර්මයට අනුව පදාර්ථ නවයක් හා එම පදාර්ථ නවය සත් වැකිරුම් අභිධානයන් අනුව උපවර්ග රාශියකට බෙදී යයි. ඒ අනුව සංශයවාදී චින්තන කණ්ඩායම් හැට තුනක් නගන ප්‍රශ්න අනුව ගුරුකුල හැට තුනක් (9 x 7 = 63) දෘශ්‍යමාන බව ශිලාංක දක්වයි.[1] ඒ හැර සෙසු ගුරුකුල සතර තැනීමට පාදක කර ගෙන ඇත්තේ ඔවුන් විමසන ප්‍රශ්න සතරකි. එනම්,

- සති භාවොත්පත්තිඃ කො වෙත්ති? මනෝ විද්‍යාත්මක තත්ත්වයන්ගෙන් (චේතනාවෙන්) උපදීදැයි කවරහු දනිත්ද?
- අසති භාවොත්පත්තිඃ කො වෙත්ති? මනෝ විද්‍යාත්මක තත්ත්වයන්ගෙන් (චේතනාවෙන්) නූපදින්නේදැයි කවරහු දනිත්ද?
- සදසති භාවොත්පත්තිඃ කො වෙත්ති? මනෝ විද්‍යාත්මක තත්ත්වයන්ගෙන් (චේතනාවෙන්) උපදින්නේ ද, නූපදින්නේදැයි කවරහු දනිත්ද?
- අව්‍යකතව්‍යයො භාවොත්පත්තිඃ කො වෙත්ති? මනෝ විද්‍යාත්මක තත්ත්වයන්ගේ (චේතනාවන්ගේ) පහළ වීම අව්‍යක්ත වන්නේදැයි (කිසිවක් කිව නො හැකි හෝ පිළිතුරු දිය නො හැකි) කවරහු දනිත් ද? යනාදිය යි.

14. වික්‍රමසිංහ අනුර. එන්, ප්‍රාග් බෞද්ධ භාරතීය ආගම් දර්ශන සම්ප්‍රදා විචාරාත්මක හඳුන්වා දීමක්, කතෘ ප්‍රකාශනයකි. 2008, පි. 61.

15. ජයතිලක කේ. එන්, මුල් බුදු සමයේ ඥාන විභාගය, පි. 168.

16. එම, පි. 146.

17. දී.නි. 1, බ්‍රහ්මජාල සූත්‍රය, පි. 80.

18. එම, පි. 44.

**''තත්ථ තත්ථ පඤ්හං පුට්ඨා සමානා වාචා වික්කේපං ආපජ්ජන්ති අමරාවික්ඛෙපං චතූහි වත්ථූහි.''**

19. දී. නි. 1, බ්‍රහ්මජාල සූත්‍රය, පි. 44.

20. එම, පි. 44.

21. ඛු. නි. සුත්තනිපාතය, පුරාභේද සූත්‍රය, පි. 270.

22. ජයතිලක කේ. එන්, මුල් බුදු සමයේ ඥාන විභාගය, පි. 160.

23. දී. නි. 1, බ්‍රහ්මජාල සූත්‍රය, පි. 44.

24. එම, පි. 44.

25. එම, පි. 44.

26. බුද්ධදත්ත හිමි, පොල්ලත්තේ, පාලි, සිංහල අකාරාදිය, පි. 119.

27. ජයතිලක කේ. එන්, මුල් බුදු සමයේ ඥාන විභාගය, පි. 171.

28. සං. නි. 2, අභිසමය සංයුත්තය, පටිච්චසමුප්පාද සූත්‍රය, පි. 1.

29. ම. නි. 1, අලගද්දූපම සූත්‍රය, පි. 129.

30. ජයතිලක කේ. එන්, මුල් බුදු සමයේ ඥාන විභාගය, පි. 172.

31. දී. නි. 1, බ්‍රහ්මජාල සූත්‍රය, පි. 44.

32. එම, පි. 44.

33. එම, පි. 44.

34. ඛු. නි. 1, ධම්මපද පාලි, බාල වග්ග, 1960, පි. 38.

**''නතං කම්මං කතං සාධු - යං කත්වා අනුතප්පති**

**යස්ස අස්ස මුඛො රොදං - විපාකං පටිසේවතී''**

35. ජයතිලක කේ. එන්, මුල් බුදු සමයේ ඥාන විභාගය, පි. 160 - 161.

36. දී. නි. 1, බ්‍රහ්මජාල සූත්‍රය, පි. 46.

**''අහං බො ඉදං කුසලන්ති යථාභූතං නප්පජානාමි. ඉදං අකුසලන්ති යථාභූතං නප්පජානාමි අහඤ්චේව බො පන ඉදං කුසලන්ති..... අකුසලන්ති යථාභූතං නප්පජානන්තො, ඉදං කුසලත්ති වා.... අකුසලන්ති වා.... ව්‍යාකරෙය්‍ය, සන්තිහි බො පන සමණ බ්‍රාහ්මණා, පණ්ඩිතා නිපුණා කතපරප්පවාදා වාලවේධිරූපා වොභින්දන්තා මඤ්ඤෙ චරන්ති පඤ්ඤාගතෙන දිට්ඨී ගතානි, තෙමං තත්ථ සමානුයුඤ්ජෙය්‍යුං. සමනුගාහෙය්‍යුං සමනුභාසෙය්‍යුං....''**

37. එම, පි. 46.

38. එම,                පි. 46.

39. දී. නි. 1, බ්‍රහ්මජාල සූත්‍රය, පි. 48.

40. දී. නි. 1, බ්‍රහ්මජාල සූත්‍රය, පි. 48.

41. සුමංගල විලාසිනී 1, බ්‍රහ්මජාල සූත්‍ර වර්ණනා, පි. 110.

42. තිලකරත්න අසංග, ශූන්‍යතාවාදයෙහි දර්ශනය හා චරණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2001, පි. 38.

43. එම,                පි. 34.

44. එම,                පි. 39.

45. ඉලංගකෝන්, සමන්ත., *චතුෂ්කෝටිය, හැඳින්වීමක්*, කර්තෘ ප්‍රකාශනයකි, 2007, පි. 53.

46. සිල්වා, ද නලින්., *ද්විකෝටිකයෙන් නොලැබෙන චතුෂ්කෝටිකය*, ඉඳුවර ඃ මහාචාර්ය ඒ. ඩී. පී. කලන්සූරිය හරසරණිය, සංස් ඃ අමරසේකර, දයා., ධීරානන්ද හිමි, හඟුරන්කෙත., දිසානායක, රෝහිත., ආරිය ප්‍රකාශකයෝ, වරකාපොළ, 2004, පි. 40.

47. අරියවිමල හිමි, කොස්වත්තේ., *භාෂාව, තර්කණය හා ඥාන ගවේෂණය පිළිබඳ බෞද්ධ දෘෂ්ටිය*, සම්භාෂා ඃ චතුර්මාසික අධ්‍යයන සංග්‍රහය, සංස්ඃ අදිකාරී ඒ., වෙලගෙදර විජිත., අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ ප්‍රකාශනයකි, බත්තරමුල්ල, 1992, පි. 111.

48. තිලකරත්න, හේ. මු., *මහාචාර්ය කේ. එන් ජයතලක දර්ශනය*, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10, 2001, පි. 3.

49. *Manorathapūraṇi* - II" Editor: Walleser, Max, kopp Hermann., The Pali Text Society, Oxford, 1967, p. 305.

***"මා තක්ක හේතුති තක්ක ගාහේන මා ගන්හිතෙ"***

50. තිලකරත්න, හේ. මු., *මහාචාර්ය කේ. එන් ජයතලක දර්ශනය,* පි. 4.

51. ජයතිලක, කේ. එන්., *මුල් බුදුසමයේ ඥාන විභාගය*, පි. 418.

52. තිලකරත්න, හේ. මු., *මහාචාර්ය කේ. එන් ජයතලක දර්ශනය*, පි. 4.

53. *එම,*                පි. 5 .

54. *දීඝනිකායට්ඨකථා*, බ්‍රහ්මජාල සුත්ත වණ්ණනා, පඨම වග්ගො, සයිමන් හේවාවිතාරණ, කොළඹ, 1918, පි. 76.

***"තත්ථ චතුබ්බිධො තක්කී, අනුස්සතිකො, ජාතිස්සරෝ, ලාභී, සුද්ධතක්කිකෝ'ති"***

55. දී. *නි;* 1, බ්‍රහ්මජාල සූත්‍රය, පි. 26 - 52.

56. මේධානන්ද හිමි, දේවාලේගම., *තර්කය පිළිබඳ බෞද්ධ විචාරය*, සම්භාෂා, චතුර් මාසික අධ්‍යාපන සංග්‍රහය, 4වන කලාපය, සංස්: අදිකාරි ඒ., වෙලගෙදර, විජිත., අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යංශයේ පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ ප්‍රකාශනයකි, බත්තරමුල්ල, 1992, පි. 118.

57. *ම.නි;* 2, සන්දක සූත්‍රය, පි. 322.

***"ඉධෙකච්චො සත්ථා තක්කී හොති වීමංසි, සො තක්ක පරියාහතං, විමංසානුචරිතං සයං පටිභානං ධම්මං දේසෙති. තක්කිස්ස ඛො පන.... සත්ථුනො විමංසිස්ස සුතක්කිතම්පි හොති දුත්තක්කිතම්පි හොති, තථාපි හොති අඤ්ඤථාපි හොති."***


## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

**ප්‍රාථමික මූලාශ්‍රය**

*දීඝනිකාය,* බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා පුනර්මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 1 1962, 2 1976, 3 1976.

*දීඝනිකායට්ඨකථා,* සයිමන් හේවාවිතාරණ මුද්‍රණය, කොළඹ, 1918.

*දීඝනිකායටීකා,* සෝමාවතී හේවාවිතාරණ, මරදාන, 1967.

*ධම්මපදට්ඨකථා* 1, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2009.

*පපඤ්චසූදනී* 1, හේවාවිතාරණ මුද්‍රණය , 1948.

*පපඤ්චසූදනී* III, සිංහල පරිවර්තනය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2008.

*මජ්ඣිමනිකාය,* බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා පුනර්මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල,1 1973, 2 1973, 3 1974.

*මනෝරථපූරණී,* හේවාවිතාරණ මුද්‍රණය, 1923.

*සංයුත්තනිකාය,* බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා පුනර්මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 1 1960, 2 1962, 3 1983, 4 1981, 5 I 1982, 5 II 1983.

*සුත්තනිපාත,* බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා පුනර්මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 1977.

*Manorathapūraṇi* – II, Editor: Walleser Max, Kopp Hermann, The Pali Text Society, Oxford, 1967.

*Ibid* - III, Editor: Kopp Hermann, The Pali Text Society, Oxford,1998

**ද්විතීයික මූලාශ්‍රය**

ඉලංගකෝන්, සමන්ත., *චතුෂ්කෝටිය: හැඳින්වීමක්,* කර්තෘ ප්‍රකාශනයකි, 2007.

එම, *චින්තන ධාරා,* සමන්ති පොත් ප්‍රකාශකයෝ, ජා-ඇල, 2007.

උත්තරානන්ද හිමි, ඉඳුරුවේ., *දෘෂ්ටි විභාගය*, ඉඳුරුව මුද්‍රණ ශිල්පියෝ, ඉඳුරුව, 1972.

කරුණාසිංහ, මුදිතා., *චීන දර්ශනය*, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10, 2010.

කලන්සූරිය, ඒ.ඩී.පී., *ග්‍රීක දර්ශනය*, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, බත්තරමුල්ල, 2007.

එම, *දර්ශනයඃ හැඳින්වීමක්*, ආරිය ප්‍රකාශකයෝ, වරකාපොළ, 2002.

එම, *දාර්ශනික ගැටලු සහ විට්ගන්ස්ටෛන්*, සී/ස, ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට්ස් සමාගම - පොත් ප්‍රකාශකයෝ, කොළඹ 02, 1986.

එම, *නූතන බටහිර දර්ශනය*, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, බත්තරමුල්ල, 2007.

එම, *බටහිර විශ්ලේෂී දර්ශනය*, ආරිය ප්‍රකාශකයෝ, වරකාපොළ, 2008.

Kalansuriya. A.D.P., *The Buddha's Discourse and Wittgenstein*, The Compassion Buddhist Institute, Sri Lanka, 2003.

කලුපහන, ඩී.ජේ., *භාරතීය දර්ශන ඉතිහාසය*, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන අංශය, 1963.

එම, *බෞද්ධ දර්ශන ඉතිහාසය*, තිවිර ප්‍රකාශන, නුගේගොඩ, 2003.

කාරියවසම්, තිලක්., *බෞද්ධ දර්ශනය හා සංස්කෘතිය - සංකල්පීය විග්‍රහයක්*, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10, 2008.

ඛේමානන්ද හිමි, හෑගොඩ., *ථෙරවාද න්‍යාය*, කර්තෘ ප්‍රකාශනයකි, 1992.

ගල්මංගොඩ, සුමනපාල., *ආදී බෞද්ධ දර්ශනය, මූලධර්ම විග්‍රහයක්*, සරස්වතී ප්‍රකාශන, දිවුලපිටිය, 2007.

ජයතිලක, කේ. එන්., *මුල් බුදුසමයේ ඥාන විභාගය*, පරිඃහේ.මු. තිලකරත්න., එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10, 2003.

ජයතිලක, කේ., *දර්ශනවාද අසබඩින්*, ප්‍රදීප ප්‍රකාශකයෝ, කොළඹ 12, 2005.

ජයසේකර, කමනී., *ග්‍රීක දර්ශනයට පිවිසුමක්*, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10, 2002.

තිලකරත්න, අසංග., *ශුන්‍යතාවාදයෙහි දර්ශනය හා චරණය*, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2001.

තිලකරත්න, හේ. මු., *මහාචාර්ය කේ. එන්. ජයතලක දර්ශනය*, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10, 2001.

තිලකසිරි, ජේ., *වෛදික සාහිත්‍යය, කාණ්ඩය* 1, ලංකාවේ සී/ස ප්‍රවෘත්ති පත්‍ර සමාගම, කොළඹ, 1958.

තෝමස්, ඊ.ජේ., *බුද්ධ චරිතය*, ඇම්. ඩී. ගුණසේන, කොළඹ 10, 1966.

වික්‍රමසිංහ, අනුර. එන්., *ප්‍රාග් බෞද්ධ භාරතීය ආගම් දර්ශන සම්ප්‍රදා විචාරාත්මක හඳුන්වාදීමක්*, කර්තෘ ප්‍රකාශනයකි. 2008.

විජේරත්න, ආනන්ද., *ශ්‍රමණ සම්ප්‍රදාය (ෂඩ් ශාස්තෘවරුන් ඇතුළු බුද්ධ කාලීන භාරතීය ශ්‍රමණ සම්ප්‍රදා පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්)* කර්තෘ ප්‍රකාශනයකි, 2004.

Keith, A. Berridale., *Buddhist Philosophy; in Indian and Ceylon*, Munshirum Manoharlal Publishers, pvt, Ltd, 1979.

Jayatilake, K. N., *The Buddhist Attitude to Relvelation, Feeds of Buddhist Thought*, K.N. Jayathilaka weel, B.P.S, Kandy, 1984.

**සඟරා ලිපි**

අරියවිමල හිමි, කොස්වත්තේ., *පූර්වාන්ත අපරාන්ත කල්පනයන් පිළිබඳ බෞද්ධ විචාරය*, පූජ්‍ය කොස්වත්තේ අරියවිමල හිමි - විවරණ සංග්‍රහය, සංස්ඃ පඤ්ඤාරතන හිමි, මහමිතව., සමිත හිමි, රත්මල්වැටියේ., මාගධී පාලි හා බෞද්ධ අධ්‍යයන ප්‍රකාශන ආයතනය, පුවක්පිටිය, 2011.

එම, *බුදුදහමින් විඥානවාදී ස්ථාවරයක් අවධාරණය වේද?,* නිවන්මග, මතවාද විමර්ශන අංකය, විසි හතර කලාපය, සංස්ඃ පෙරේරා, ටෙනිසන්., රජයේ මුද්‍රණාලයීය බෞද්ධ සංගමය, බු.ව. 2537.

එම, *භාෂාව, තර්කණය හා ඥාන ගවේෂණය පිළිබඳ බෞද්ධ දෘෂටිය*, සම්භාෂා ඃ චතුර්මාසික අධ්‍යයන සංග්‍රහය, සංස්ඃ අදිකාරී, ඒ., වෙලගෙදර, විජිත., අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ ප්‍රකාශනයකි, බත්තරමුල්ල, 1992.

ගල්මංගොඩ, සුමනපාල., *දාර්ශනික විග්‍රහයන්හිලා භාෂාවේ උපයෝගීත්වය පිළිබඳ ථෙරවාද විවරණ,* මානව ශාස්ත්‍ර පීඨ ශාස්ත්‍රීය සංග්‍රහය, 2 කලාපය, කැලණිය විශ්වවිද්‍යාලයීය 40 වැනි සංවත්සර කලාපය, සංස් ඃ කරුණාතිලක, ඩබ්. ඇස්., පල්ලියගුරු, චන්ද්‍රසිරි., කැලණිය විශ්වවිද්‍යාලය, 1999.

තිලකරත්න, අසංග., *ඥානයෙහි අවාච්‍යත්වය පිළිබඳ ගැටලුව*, ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම, ශාස්ත්‍රීය සංග්‍රහය, සංස්ඃ සෝමානන්ද හිමි, තෙරිපැහැ., ධම්මපාල හිමි, යටගම., සේනානායක, ජී. එස්. බී., අදිකාරී, අබයරත්න., විතානගේ, සිරිසේන., ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම මගින් ප්‍රකාශිත ය. 1999.

එම, *බෞද්ධ චතුෂ්කෝටි තර්ක ක්‍රමයෙහි අර්ථය කුමක්ද?,* ප්‍රසාදිනී, කන්දෙගෙදර ශ්‍රී සුමනවංශ මහ නා හිමි ශාස්ත්‍රීය උපහාරය, සංස් ඃ විමලසාර හිමි, නෙළුම්දණ්ඩේ., සංස්කාරක ප්‍රකාශනයකි, 1995.

මේධානන්ද හිමි, දේවාලේගම., *තර්කය පිළිබඳ බෞද්ධ විචාරය,* සම්භාෂා, චතුර් මාසික අධ්‍යාපන සංග්‍රහය, 4වන කලාපය, සංස්ඃ අදිකාරී, ඒ., වෙලගෙදර, විජිත., අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යංශයේ පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ ප්‍රකාශනයකි, බත්තරමුල්ල, 1992.

සිල්වා, ද නලින්., *ද්විකෝටිකයෙන් නොලැබෙන චතුෂ්කෝටිකය,* ඉඳුවර ඃ මහාචාර්ය ඒ. ඩී. පී. කලන්සූරිය හරසරණිය, සංස් ඃ අමරසේකර, දයා., ධීරානන්ද හිමි, හඟුරන්කෙත., දිසානායක, රෝහිත., ආරිය ප්‍රකාශකයෝ, වරකාපොළ, 2004.